# දැන්වීමයි

## සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

# සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම - 2021

සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක II ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 02 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 02 |

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : **2021.08.15**

03. බඳවා ගැනීමේ සුදුසුකම් :

| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) සඳහා | භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) සඳහා |
|---|---|
| (i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල/ දෙමළ භාෂාව ඇතුළු විෂයයන් 04 කට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම<br>සහ<br>(ii) (දෙවන භාෂාව (සිංහල/ දෙමළ) විෂයයට අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම<br>සහ<br>(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනැමෙන දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් ලබා තිබීම<br>සහ<br>(iv) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයකින් පිරිනැමෙන පශ්චාත් උපාධියක් ලබා තිබීම. | (i) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල භාෂාව, ඉංග්‍රීසි විෂය ඇතුළු විෂයයන් 05කට සම්මාන සහිතව විෂයයන් හයකින් සමත් වී තිබීම<br>සහ<br>(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පිරිනැමෙන ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් වශයෙන් ඇතුළත් උපාධියක් ලබා තිබීම.<br>සහ<br>(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයකින් පිරිනැමෙන පශ්චාත් උපාධියක් ලබා තිබීම. |

03. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය.

05. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය :අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව **භාෂා පරිවර්තක II වැනි ශ්‍රේණියට** අදාළ වැටුප් කාණ්ඩය MN 6 - 2016 වන අතර, වැටුප් පරිමාණය රු. 36,585- 10X660-11X755- 15X930- රු.65,440/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ඉහළම කුසලතාවය ලබා ගන්නා අයදුම්කරුවන් සඳහා පමණක් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පත්වීම් ලබා දීම සිදුකෙරේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍ර www.sg. gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

**පී.එස්. ආර්.එම්.විජයරාජ**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත.**
**2021.07.09**